බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි31 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක නොවූ කර්මාන්ත 03 කට අදාල වියදම් රු.236,356 ක් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ii) | ඉකුත් වර්ෂයට අදාළව අයකර නොතිබූ උසාවි දඩ රු.113,558 ක් ගිණුම්වල ගලපා නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.1,918,396 ක් රු.1,741,839 ක් ලෙසට ගිණුම් ගතකර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.14,905,400 ක් රු.14,458,238 ක් ලෙස දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පත් ගිණුමකට අදාලව ලැබිය යුතු පොලිය රු.306,805 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (vi) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ආයෝජන රු.10,306,805 ක් ගිණුම් වල දක්වා නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කරමි. |

(ආ) <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------------------- | -------------------------------- | ---------------------- |
| එකතුව රු.20,091,031 ක් වූ වත්කම් විෂයයන් 02 ක් හා රු.4,972,989 ක විවිධ තැන්පත් ශේෂය අදාල ඔප්පු, පිඹුරුපත්, පැවරුම් නියෝග, විස්තරාත්මක උපලේඛන සහ ස්ථාවර වත්කම් ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදි සාක්ෂි සමඟ ඉදිරිපත් කරමි. |

1.4 <u>අනුකූල නොවීම</u>

<u>නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

| | නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | -------------------------- | ------------------------------- | ----------------- | ------------------------ |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 47 (1) හා 49 (ආ) වගන්ති | 2014 හා 2018 වර්ෂවල සභාව අනුමත කරන ලද නව ගොඩනැඟිලි ඉදිකිරීම් 208 කින් 173 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | ගොඩනැඟිලි ඉදිකිරිම සඳහා සභාවේ අනුමැතිය ලබාගත යුතුවේ. | නීති රීති අනුගමනය කිරිමට 2019 වර්ෂයේ කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.6 වගන්තිය | ස්ථාන මාරුවී ගිය හා සේවය හැර ගිය නිලධාරින් 04 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.457,637 ක හිඟ ණය ශේෂය අය කරගෙන නොතිබුණි. | අයවිය යුතු හිඟ ණය ශේෂ අය කරගත යුතුවේ. | නීති රීති අනුගමනය කිරිමට 2019 වර්ෂයේ කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කර මාස 06 ක් ඉක්මවු ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු.18,413 ක චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | නීති රීති අනුගමනය කිරිමට 2019 වර්ෂයේ කටයුතු කරමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,342,374 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,306,215 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 274,000 | 274,000 | 458,492 | 856,840 | 287,200 | 287,200 | 353,522 | 890,892 |
| ii. | බලපත්‍ර ගාස්තු | 500,000 | 500,000 | 449,650 | 50,350 | 290,000 | 290,000 | 450,222 | - |
| iii. | වෙනත් | 6,400,000 | 6,400,000 | 17,589,104 | 4,255,271 | 4,494,200 | 4,494,200 | 19,128,423 | 12,311,069 |
| | එකතුව | 7,174,000 | 7,174,000 | 18,497,246 | 5,162,461 | 5,071,400 | 5,071,400 | 19,932,167 | 13,201,961 |

#### 2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

#### 2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරනලද රු.7,174,000 ක මුළු ආදායමින් වර්ෂය අවසානය වනවිට රු.5,162,461 ක් අය කරගෙන නොතිබුණු අතර,එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 72 ක් විය. | හිඟ ආදායම් අය කරගත යුතුවේ. | සියළුම හිඟ ආදායම් ප්‍රවර්තන වර්ෂයේ අය කර ගැනීමට සැලසුම් කර ඇත. |
| (ආ) වසරකට අධික කාලයක සිට පැවත එන එකතුව රු.23,723,225 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

(අ) <u>උසාවි දඩ</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු.1,918,396 හා මුද්දර ගාස්තු රු.14,458,238 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කරමි. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මං මාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන්,ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද,සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට කාරණා 07 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා හෝ වැළඳගෙන හෝ නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීම හෝ වැළඳගැනීම කළ යුතුවේ. | 2019 වර්ෂයේ අතුරු ව්‍යවස්ථා හා තිරසාර සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. |

(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද,සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත. |

3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 04 කට අදාලව 05ක අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරගෙන නොතිබුණි.එක් පුරප්පාඩුවක් පුරවා නොතිබුණි. | කාර්ය මණ්ඩලය අනුමත කරගත යුතුවේ. | අතිරික්ත කාර්ය මණ්ඩලය හා ඌනතා තනතුරු සම්පූර්ණ කර ප්‍රශස්ථ |

| | | |
|---|---|---|
| | | මට්ටමක පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබාදුනිමි. |

3.3 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසරකට අධික කාලයක සිට පැවත එන වියදම් ණය හිමි රු.399,523 ක් සහ කර්මාන්ත ණය හිමි රු.6,508,329 ක් ලෙස එකතුවරු.6,907,852 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මුදල් ප්‍රතිපාදන ලැබුණු විගස ගෙවා පියවීමට පියවර ගන්නා බව. |

3.4 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේ නිවැරදි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කරමි. |

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(01) දරන චක්‍රලේඛය අනුව කාර්තුවකට එක් වතාවක් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදි විගණන හා කළමනාකරණ කමිටු 01 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුවේ. | කාර්තු 04 සඳහාම විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට සැලසුම් කර ඇත. |